## නීතිපති දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල් තනතුර/ අතිරේක සොලිසිටර් ජනරාල් තනතුර සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය

**01. සම්බන්ධවන ආයතන**

1.1 දෙපාර්තමේන්තුව : නීතිපති දෙපාර්තමේන්තුව යොමු අංකය : ආ01/08/2013 (උප-4) දිනය : 2012.12.19

1.2 අමාත්‍යාංශය : ජනාධිපති කාර්යාලය යොමු අංකය : E&O/AC/3/1/70(1) දිනය : 2014.05.30
අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය MOJ/E08/01/02-2015 දිනය :

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම : යොමු අංකය : DMS/ JR/07/02 දිනය : 2005.09.02
DMS/ 1007 2014.01.30
DMS/1007 2014.02.12
DMS/1007/VOL II 2014.10.01

1.4 ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය : යොමු අංකය : EST-2/RECRU/05/4526 දිනය : 2014.08.11

1.5 ජාතික වැටුප් කොමිෂන් සභාවේ නිර්දේශය : යොමු අංකය : NSCC/02/23/109/SR දිනය : 2019.01.04

1.6 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය : යොමු අංකය : PSC/EST/04-01-53/02/2014 දිනය : 2018.05.31

**02. පත්කිරීම් බලධරයා :** රාජ්‍ය සේවා කොමිෂන් සභාව

**03. සේවා ගණය පිළිබඳ විස්තර:**

3.1 සේවා ගණය : නීතිපති නිලධාරී සේවය (Attorney General's Officers Service)

3.2 ශ්‍රේණි : අදාළ නොවේ.

3.3 පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා අනෙකුත් නීති රීති රෙගුලාසි මගින් නීතිපති තනතුරට පැවරෙන බලතල හා කාර්ය භාරයන් අතුරින් තනතුරු නිශ්චිත කොට පවරා දෙනු ලබන කාර්යයන් ක්‍රියාත්මක කිරීම.

**04. තනතුරෙහි ස්වභාවය :** මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය.
( සටහන - විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට යටත් විය යුතුය.)

**05. වැටුප් :**

5.1 අනුමත තනතුරු නාමය, වැටුප් කේත අංකය හා මාසික වැටුප් පරිමාණය

| තනතුරු නාමය | වැටුප් කේත අංකය | මාසික වැටුප් පරිමාණය (රු.) |
|---|---|---|
| ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල් | AGS 7 | රු. 135,000 -10x2,750-162,500/- |
| අතිරේක සොලිසිටර් ජනරාල් | AGS 6 | රු. 120,000 -10x2,750-147,500/- |

**06. සේවා ගණයට අයත් තනතුර/තනතුරු:**

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් :

| අනුමත තනතුරු නාම | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|
| ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල් | 02 | නීතිපති තනතුරට පැවරෙන බලතල හා කාර්යයන් අතුරින් තනතුරට නිශ්චිත කාර්යයන් හා පැවරෙන රාජකාරි |
| අතිරේක සොලිසිටර් ජනරාල් | 09 | නීතිපති තනතුරට පැවරෙන බලතල හා කාර්යයන් අතුරින් තනතුරට නිශ්චිත කාර්යයන් හා පැවරෙන රාජකාරි |

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව : ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල් - 02
අතිරේක සොලිසිටර් ජනරාල් - 09

**07. බඳවා ගැනීමේ ක්‍රමය :**

| පත් කරනු ලබන තනතුර | සපුරාලිය යුතු සුදුසුකම් |
|---|---|
| i. ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල් | i. පත් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට නීතිපති දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨතම අතිරේක සොලිසිටර් ජනරාල්වරයා වීම.<br>ii. සුදුසුකම් ලබන දිනට ආසන්න වසර 5 ක කාලසීමාවක් තුළ සතුටුදායක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.<br>iii. පසුගිය වසර 05ක කාලය තුළ අවවාද කිරීමක් හැර වෙනත් විනය දඬුවමක් ලබා නොතිබීම. |
| ii. අතිරේක සොලිසිටර් ජනරාල් | i. පත් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට නීතිපති දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨතා ලේඛනයේ ඉහළින්ම සිටින ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්වරයා වීම.<br>ii. සුදුසුකම් ලබන දිනට ආසන්න වසර 5 ක කාලසීමාවක් තුළ සතුටුදායක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.<br>iii. පසුගිය වසර 05ක කාලය තුළ අවවාද කිරීමක් හැර වෙනත් විනය දඬුවමක් ලබා නොතිබීම. |

**08. කාර්යක්ෂමතා කඩඉම්** : අදාළ නොවේ.

**09. රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය** : අදාළ නොවේ.

10. **ශ්‍රේණි උසස් කිරීම** : අදාළ නොවේ.

11. **තනතුරුවලට පත්කිරීම** :

11.1 පත් කිරීමේ ක්‍රමය :

i. ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල් :

ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල් තනතුර පුරප්පාඩු වීමෙන් පසුව අතිරේක සොලිසිටර් ජනරාල්වරුන් අතරෙන් ජ්‍යෙෂ්ඨතා ලැයිස්තුවේ ඉහළින්ම සිටින අතිරේක සොලිසිටර් ජනරාල්වරයා නීතිපතිවරයාගේ නිර්දේශය මත පත් කිරීමේ බලධරයා විසින් පත් කිරීම සිදු කරනු ලැබේ.

ii. අතිරේක සොලිසිටර් ජනරාල් :

අතිරේක සොලිසිටර් ජනරාල් තනතුර පුරප්පාඩු වීමෙන් පසුව ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්වරුන් අතරෙන් ජ්‍යෙෂ්ඨතා ලැයිස්තුවේ ඉහළින්ම සිටින ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්වරයා නීතිපතිවරයාගේ නිර්දේශය මත පත් කිරීමේ බලධරයා විසින් පත් කිරීම සිදු කරනු ලැබේ.

12. **රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසිවලට පරිබාහිර වන්නා වූ කොන්දේසි :**

12.1 මෙම බඳවාගැනීම් පරිපාටියේ සඳහන් විධිවිධානවලට අමතරව ආයතන සංග්‍රහයේ සහ අංක: 1589/30 හා 2009.02.20 දිනැතිව ප්‍රකාශිත රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලට සෑම නිලධරයකුම යටත් වේ.

13. **රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපනවලට පරිබාහිර වන්නාවූ අර්ථ නිරූපන :**

"සක්‍රිය සේවා කාලය යනු වැටුප් රහිත නිවාඩු කාලයන් ඇතුළත් නොවන. එහෙත් අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්තියක් ලෙස සක්‍රිය සේවා කාලයක් ලෙස සැලකිය යුතුයැයි විශේෂිතව සඳහන් කරනු ලැබ ඇති වැටුප් රහිත නිවාඩු කාලයන් ද ඇතුළත්. නිලධාරියෙකු ස්වකීය තනතුරට අදාල වැටුප් ලබමින් සිටි සේවා කාලය වේ."

14. **ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය (බඳවා ගැනීමේ පටිපාටිය) ක්‍රියාත්මක වන දිනට සේවයේ නියුතුවූවන් සඳහා**

නව බඳවා ගැනීමේ පටිපාටිය ක්‍රියාත්මක වන දිනට රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යංශ EST 5/4/24(XIX)-9 අංක හා 2018.02.21 දිනැති ලිපිය අනුව AGS-7-2016 වැටුප් පරිමාණයෙහි ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල් තනතුරේ වැටුප් ලබන නිලධාරීන් දෙදෙනා සහ AGS-6-2016 වැටුප් පරිමාණයෙහි අතිරේක සොලිසිටර් ජනරාල් තනතුරේ වැටුප් ලබන නිලධාරීන් නවදෙනා ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4 පරිච්ඡේදයේ විධිවිධාන වලට යටත්ව එම තනතුරු සඳහා අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

කෙසේවතුදු අන්තර්ග්‍රහණය හේතුවෙන් අදාළ නිලධාරින්ගේ වැටුපෙහි හා වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදුනොවිය යුතු අතර. එම දිනය අන්තර්ග්‍රහණයට පෙර පැවති වැටුප් වර්ධක දිනය වශයෙන් නොවෙනස්ව ක්‍රියාත්මක විය යුතුය. එසේම වැටුප් පරිවර්තනයේදී අදාළ තැනැත්තන් අවසන් වරට ලබමින් සිටි වැටුප් පියවර අනුරූපී වීම මත ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4.4 වගන්තිය අනුව ඊළඟ ඉහළ වැටුප් පියවරේ තැබීම ද නොකළ යුතුය.

**15.** සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම ආයතන සංග්‍රහයේ විධිවිධාන හා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට්පත්‍රයෙන් ප්‍රකාශිත කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන කොන්දේසි අදාළ වේ.

**16.** මෙම බඳවා ගැනීමේ පරිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් **"රාජ්‍ය සේවා කොමිෂන් සභාව"** විසින් තිරණය කරනු ලැබේ.

**17.** **අන්තර්කාලීන විධිවිධාන :** අදාල නොවේ.

සකස් කළේ: අත්සන . ..................
සුදර්ශන ද සිල්වා
නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් (පරිපාලන)
(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධරයා)
නීතිපති වෙනුවට
නම : ..................
තනතුර : ..................
දිනය : 2019. 02 . 20

පරීක්ෂා කළේ : අත්සන : ..................
(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධරයා)
නම : සුමති ධර්මවර්ධන
තනතුර : ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් (පරිපාලන) නීතිපති වෙනුවට
දිනය : 2019. 03 . 13

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ..................
(දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම : ජයන්ත ජයසූරිය
තනතුර : ජනාධිපති නීතිඥ, නීතිපති
නිල මුද්‍රාව : ..................

දිනය : 2019. 03. 13

යොමු අංකය : M 05/ E 08/01/14/2013 (M)

නීතිපති දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල් තනතුර සහ අතිරේක සොලිසිටර් ජනරාල් තනතුර සඳහා 2018.05.31 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද බඳවා ගැනීමේ පරිපාටිය සහතික කිරීම සඳහා නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ..............................

නම : ..............................

ලේකම්,
අධිකරණ හා බන්ධනාගාර
ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

තනතුර : Piyumanthi Peiris

දිනය :2019.

නිල මුද්‍රාව: Secretary (Acting)
Ministry of Justice and Prison Reforms
Colombo 12.

---

යොමු අංකය : PSC/EST/04-01-63/02/2014

නීතිපති දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල් තනතුර සහ අතිරේක සොලිසිටර් ජනරාල් තනතුර සඳහා වන මෙම බඳවා ගැනීමේ පරිපාටිය 2018.05.31 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

අත්සන : ..............................

නම : එම්. ඒ. බී. දයා සෙනරත්

ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

තනතුර : ..............................

දිනය :2019. 11.20

නිල මුද්‍රාව: එම්. ඒ. බී. දයා සෙනරත්
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
නො. 1200/9, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.